www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

10 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | 5 ඒකකය

## ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය

### I කොටස

- **පහත 1 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

01. ගැටුම් පිළිබඳව අධ්‍යයනය කිරීමේදී යොදා ගනු ලබන ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින්ද?
    (1). ජොහැන් කෙප්ලර් (3). ටී.බී. ටයිලර්
    (2). ජොහාන් ගැල්ටුන් (4). මහාචාර්ය ගානර්

02. ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතියේ සංකල්ප පිළිවෙලින් විස්තරවන පිළිතුර වන්නේ,
    (1). සන්දර්භය, චර්යාව හා ආකල්ප (3). ආකල්ප, චර්යාව හා සන්දර්භය
    (2). චර්යාව, ආකල්ප හා සන්දර්භය (4). චර්යාව, සන්දර්භය හා ආකල්ප

03. වාර්ගික, ආගමික, කුල, ගෝත්‍ර අතර විවිධ පරස්පරතා, මතභේද නිසා ඇතිවන ගැටුම් ආදිය ඇතිවිය හැක්කේ,
    (1). පවුල් තුළය (3). රාජ්‍ය හෝ රාජ්‍යය දෙකක් අතරය
    (2). පුද්ගල කණ්ඩායම් අතරය (4). රාජ්‍යයක් තුළය

04. සාර්ව ගැටුම් සඳහා උදාහරණයක් වන්නේ,
    (1). ජන වර්ග අතර ඇතිවන ගැටුම් (3). පවුල් තුළ ඇතිවන ගැටුම්
    (2). පවුල් අතර ඇතිවන ගැටුම් (4). පුද්ගලයින් අතර ඇතිවන ගැටුම්

05. ගැටුම් විසඳීමේදී මැදිහත්කරුවකු තුළ නොතිබිය යුතු ගුණාංගයක් වන්නේ,
    (1). මධ්‍යස්ථ බව (2). පක්ෂපාතී බව (3). අවංක බව (4). විශ්වාස බව

06. ගැටුම් නිරාකරණය සඳහා පුරවැසියකු සතු විය යුතු සමාජීය ගුණාංගයක් වනුයේ,
    (1). සංවේදී බව (3). අවිහිංසක බව
    (2). ඉවසීම (4). යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා

07. ගැටුම් නිරාකරණය සඳහා යොදාගනු ලබන සම්ප්‍රදායික ක්‍රමයක් මෙන්ම පරාජයට පත්වන පාර්ශවයට ඉහළ අධිකරණයකට අභියාචනා කිරීමේ හැකියාවකින්ද යුත් ගැටුම් නිරාකරණ ක්‍රමවේදය වනුයේ,
    (1). උපදේශනය (3). සමථකරණය
    (2). විනිසීම (4). ඒකඟත්වය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

www.agaram.lk

08. සමථකරණය යොදාගත හැකි අවස්ථාවක් වනුයේ,

(1). ජාතීන් අතර පවතින ගැටුම්
(2). කම්කරු ආරවුල්
(3). රටවල් අතර පවත්නා ගැටුම්
(4). යුධ ගැටුම්

09. සමාජ ස්ථාවරත්වය ඇති කිරීමටත් පුද්ගලයන් අතර ගැටුමක් ඇතිවූ විට සාධාරණත්වය හා අපක්ෂපාතීව විසඳා ගැනීම සඳහාත් උපකාරී වනුයේ,

(1). නීතියයි (2). යුක්තියයි (3). බලයයි (4). සදාචාරයයි

10. මතවාද ස්වභාවය මුල්කරගෙන ඇතිවන ගැටුම් සඳහා උදාහරණයක් වන්නේ,

(1). ඊශ්‍රායලය හා පලස්තීන යුද්ධය
(2). බටහිර ක්‍රිස්තියානි හා මැදපෙරදිග ඉස්ලාමීය රටවල් අතර ගැටුම්
(3). ඉන්දු-පකිස්ථාන යුද්ධය
(4). ඇමරිකාව ප්‍රමුඛ යුරෝපා ප්‍රජාව මැදිහත් වී කරන යුද්ධය

- **11 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

11. ගැටුම යන්න කෙටියෙන් හඳුන්වන්න.

..............................................................................................................................

..............................................................................................................................

12. ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය ඇඳ දක්වන්න.

13. මනසේ සාමය ඇති කර ගැනීම සඳහා පාසල් ශිෂ්‍යයකු වශයෙන් ඔබට කළ හැකි ක්‍රියාකාරකම් දෙකක් දක්වන්න. ..............................................................................................................

..............................................................................................................................

14. ගැටුම් ඇතිවන පාර්ශව දෙකක් දක්වන්න.

..............................................................................................................................

15. අන්තර්ජාතික ගැටුම් බෙදා දැක්විය හැකි කොටස් දෙක නම් කරන්න.

..............................................................................................................................

16. අන්තර්ජාතික ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන හේතු දෙකක් දක්වන්න.

..............................................................................................................................

17. ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන ප්‍රධාන මූල මොනවාද?

..............................................................................................................................

18. ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රම දෙකක් දක්වන්න.

..............................................................................................................................

19. මැදිහත්කරණය යොදා ගත හැකි අවස්ථා දෙකක් ලියන්න.

..............................................................................................................................

20. බේරුම්කරුවකු සතු විය යුතු ගුණාංග දෙකක් ලියන්න.

..............................................................................................................................

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk

## II කොටස

- **පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

01. (1). ගැටුම් සඳහා බලපාන හේතු හතරක් ලියා දක්වන්න.
    (2). ගැටුම් වර්ග පුළුල් ලෙස බෙදෙන ප්‍රධාන කොටස් දෙක දක්වා උදාහරණය බැගින් ලියන්න.
    (3). ඔබ මුහුණ දුන් ගැටුම් අවස්ථාවක් සිහිපත් කර ඊට මුල් වූ හේතු සහ ඉන් ඔබට ලැබුණු ප්‍රතිඵල මොනවාදැයි ලියා දක්වන්න.

02. (1). අභ්‍යන්තර ගැටුම් යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
    (2). ගැටුම් ඇතිවන මූල හතර නම් කර ඒ සඳහා උදාහරණය බැගින් ලියන්න.
    (3). ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රම තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

03. (1). පුද්ගලයා තුළ පැවතිය යුතු සාමාජීය ගුණාංග හතරක් දක්වන්න.
    (2). ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීමේ වාසි තුනක් ලියා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
    (3). පවුලේදී, පාසලේදී හා සමාජයේදී අන් අයට හිරිහැර කරදර ගෙන දෙන ලෙස කටයුතු නොකිරීමට කළ හැකි යෝජනා තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk